ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

**ශ්‍රී ලංකා රජයේ වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය අනුර කරුණාතිලක මහතා 2025 ඔක්තෝබර් 27-28 දිනවල ඉන්දිය සංචාරයක නිරත වේ**

ශ්‍රී ලංකා රජයේ වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය අනුර කරුණාතිලක මහතාඉන්දිය රජයේ වරාය, නාවික සහ ජලමාර්ග අමාත්‍යාංශය විසින් මුම්බායි හි බොම්බේ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ සංවිධානය කරනු ලබන ඉන්දිය සමුද්‍රීය සතිය 2025 සඳහා සහභාගි වීම සඳහා 2025 ඔක්තෝබර් 27-28 දිනවල ඉන්දිය සංචාරයක නිතර වනු ඇත.

2. සංචාරය අතරතුරදී අනුර කරුණාතිලක අමාත්‍යතුමා සහ ඉන්දිය රජයේ වරාය, නාවික සහ ජලමාර්ග අමාත්‍ය ශ්‍රී සර්බානන්ද සොනොවාල් මහතා අතර ද්විපාර්ශ්වික හමුවක් පැවැත්වෙනු ඇත. අමාත්‍යතුමා ඉන්දිය සමුද්‍රීය සතියේ අමාත්‍ය මණ්ඩලහමුව සඳහා ද සහභාගී වනු ඇති අතර සංචාරයට සමගාමීව ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ නායකයන් ද හමු වනු ඇත. අමාත්‍යතුමාගේ සංචාරය අතරතුර විවිධ ක්ෂේත්‍ර චාරිකා ද සංවිධානය කර ඇත.

3. ඉන්දිය සමුද්‍රීය සතිය ඉන්දිය රජයේ වරාය, නාවික සහ ජලමාර්ග අමාත්‍යාංශය විසින් 2025 ඔක්තෝබර් 27 සිට 31 දින දක්වා ඉන්දියාවේ මුම්බායි හිදි පැවැත්වීමට කටයුතු යොදු ඇත. මෙම සුවිශේෂී වැඩසටහන ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ අතිශය වැදගත් අවස්ථාවක් වන අතර එතුළින් ජාත්‍යන්තර සහයෝගීතාවය වර්ධනය කිරීමට සහ සමුද්‍රීය විශිෂ්ටත්වය ඉහළ නැංවීමට ඉන්දියාවේ කැපවීම පිළිබිඹු වේ.

3. මෙම වැඩසටහන සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ සහයෝගීතාවය ශක්තිමත් කිරීමට, ක්‍රමෝපායික මුලපිරීම් බලගැන්වීමට සහ නව අවස්ථාවන් වෙත දොරගුළු විවර කර ගැනීමට මාහැඟි වේදිකාවක් වනු ඇත. මෙම වැඩසටහන වෙරෙළ ආශ්‍රිත රටවලට සිය සමුද්‍රීය යටිතල පහසුකම් ඉහළ නැංවීමට, වරාය මෙහෙයුම් නවීකරණය කිරීමට සහ නාවික සහ ලොජිස්ටික් ක්ෂේත්‍රයන් සඳහා ගෝලීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අසමසම අවස්ථාවන් ලබා දෙයි. මෙම වැඩසටහනෙහි සාකල්‍ය ප්‍රවේශය තුළින් පොදු සෞභාග්‍යය උදෙසා ක්‍රමෝපායික හවුල්කාරිත්වයන් ශක්තිමත් කරමින් සියලු දෙනා ඇතුළත් වන වර්ධනය සහ තිරසාර සමුද්‍රීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි.

4. ශ්‍රී ලංකා රජයේ වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය අනුර කරුණාතිලක මහතාගේ සංචාරය දෙරටේ අතර වර්ධනය වන ආර්ථික හවුල්කාරිත්වය සහ විශේෂයෙන්ම වෙළෙඳ, ලොජිස්ටික් සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි විවිධ

ක්ෂේත්‍රයන්හි ද්විපාර්ශ්වික සහයෝගිතාවය ඉහළ නැංවීමට දෙරටෙහිම කැපවීම අවධාරණය කරයි.

***

**කොළඹ**
***2025* ඔක්තෝ*බර් 23***